# දඹදිව වන්දනාවේදී මා දුටු තවත් පැත්තක්!



**ප**සුගිය මාසයේ මා තව නව දෙනෙකු සමග ඉන්දියාවේ බුදුන් වහන්සේ වැඩසිටි තැන් බැලීමට ගියේ ඉතා භක්තියෙනි. බුද්ධගයාව අතිශය ආකර්ශණීය ස්ථානයක් වන අතර, බුදුන්වහන්සේ බුද්ධත්ව යට පත්වුණු තැන පිහිටි බෝගස් යට සෙවනට සිටින විට මා නොදැනුවත්වම තුටු කඳුළු මා දෑසට නැගුණේ මා කොතරම් වාසනාවන්තද යන සිතුවිල්ල සමග ඇතිවූ අසීමිත ප්‍රීතිය ද නිසාය.

**දඹදිව වඳින්නට යන බෞද්ධ සැදහැවතුන් කුසිනාරාවේ පිරිනිවන් මංචකය දැක වැඳ කඳුළු සලති. කඳුළු සලන්නට තවත් දේ ද දඹදිව සිදුවේ. මේ ලිපිය ඒ ගැනය.**



බොරු හාමුදුරුවරු වන්දනාකරුවන් එනතුරු එරමිණියගොතාගෙන බලා සිටින හැටිය මේ.

ධර්මාශෝක රජතුමාගේ සහ ධර්මපාලතුමාගේ දූරදර්ශී ක්‍රියා මාර්ගයන් නිසා අද අපට එම පූජනීය ස්ථාන දැක බලා වැඳපුදා ගන්නට ප්‍රස්ථාව ලැබී ඇත. ඒවා වැනසී යා නොදී ඉදිරියටත් ආරක්ෂාකිරීම අපේ යුතුකමක් බව සිතෙන නිසා මෙම ලිපිය ලියන්නට මම අදහස් කළෙමි.

බුදුන් උපන් ලුම්බිණියේදීත්, උන්වහන්සේ බුදුවුණු ගයාවේදීත්, පිරිනිවන් පෑ කුසිනාරා නගරයේදීත් ඒ ගමනට එක්වුණ අප නඩයේ කාටත් ඇස් දෙකින්ම දැකගතහැකිවූ දෙයක් නම් විශාල සංඛ්‍යාවක් වූ ශ්‍රමණ වේශධරීන් හෙවත් සිවුරු පොරවාගෙන සිටින බොරු හාමුදුරුවරුන්ය. සිවුරක් ඇඟේ දවටාගෙන ඔවුන් පාත්තරයක් ද අතට ගෙන යන එන වන්දනාකරුවන්ගෙන් සංචාරකයන්ගෙන් මුදල්, පඬුරු හා කෑම බීම බලාපොරොත්තුවෙන් කරන රඟපෑමේ ප්‍රෝඩාව හොඳින් අපට වැටහිණ. සමහරුන්ට දිග කොණ්ඩාද ඇත. ඇතැමුන් කොණ්ඩ හොඳට කපා, නවගුණ වැලක් අතේ දරා, භාවනා කරන විලාශයෙන් සිටිමින් යන එන අය දිහා හොරෙන් බලන සැටිත් අපි දුටුවෙමු. කිසිවෙකු ළඟින් යන විට මෙම බොරු හාමුදුරුවරු ඔවුන්ට ඇසෙන්නට සාධු සාධු යයි කියති. ඔවුන් දන්නේ ඒ වචන දෙක පමණකි. වන්දනා නඩ හා සංචාරකයෝ ඔවුන්ට මුදල් දෙනවා අපට දැකගත හැකිවිය. ඇතැම් සැදැහැවත්තු බුද්ධාලම්බන ප්‍රීතියෙන් යුතුව ගෙනගිය සිවුරු පූජාකරන්නේ එම කපටින්ටය. එය ඔවුන්ගේ දෛනික රැකියාව බවට පත්ව තිබේ. මෙම සිවුරු ඔවුන් පමණක් නොව ඔවුන්ගේ පවුලේ අයද (ගැහැණු හා ළමයින්) පොරවාගෙන තැන් තැන්වල වාඩිවී සිටිනු දුටුවෙමි. අප නඩයේ කෙනෙක් එක් ශ්‍රමන වේශධාරියෙකුගෙන් මේ දිග කොණ්ඩයක් ඇයි දැයි ඇසූ විට ඔහු දුන් පිළිතුර මම මේක හෙට කපන්න හිතාගෙන ඉන්නේ යන්නයි. ඔහු පොරවාගෙන සිටි සිවුරට යටින් කිසියම් පින්තාරුවක් මුද්‍රණය කළ ටීෂර්ට් එකක් ඇඳගෙන සිටියේය. මෙවැනි ප්‍රෝඩාකාරයින් ගැන සොයා බලන්නට කෙනෙක් නැත.



බුද්ධගයාවේ පැරණි ස්ථූපයක් කඩමින් පිරිසක් එහි ගඩොල් ඉවත්කරන හැටිය මේ

මගේ සිත සසල කළ අනෙක් කාරණය නම් කපිලවස්තුපුර ස්තූපය වටේ ඇති ගඩොල් ඉන්දියානු මිනිසුන් කීප දෙනෙකු විසින් කඩනු දක්නට ලැබීමයි. එම ස්තූපය තුළ බුදු හාමුදුරුවන් පිනිවන් පෑ පසු උන්වහන්සේගේ නෑදැයින්ට ලැබුණු ධාතූන් වහන්සේලා තැන්පත් කර ඇත. ස්තූපයේ වටරවුම එසේ කඩන්නේ ඇයිදැයි ඒ ඉන්දියානු කන්කානම්ගෙන් ඇසූ කල ඔහු දුන් පිළිතුර වර්ෂා කාලයට පෙර පැලී ඇති තැන් රෙපයාර් කිරීමට බවයි. එහෙත් ඒ කියන විදියේ කිසිදු තැනක් පැලී තිබුණේ නැත. අවුරුදු 2600 ක් පමණ කාලයක් පුරා පැවති මෙවැනි ස්ථූප මෙසේ ක්‍රමයෙන් කඩාදැමීම ගැන සොයා බැලීම වගකිව යුත්තන්ගේ යුතුකමකි.

ජපන්, චීන, කොරියන් සහ ලාංකික වන්දනාකරුවන් විශාල සංඛ්‍යාවක් සිද්ධස්ථාන වැඳපුදා ගැනීමට ඉන්දියාවට පැමිණෙන අතර, ඔවුන්ගෙන් විශාල මුදලක් ඒ තැන්වලට ලැබුණත්, ඒවා දියුණු කිරීමට යොදවන්නේ ඉන් 10 ට කටත් අඩු ප්‍රමාණයක් බව අපට දැනගන්නට ලැබිණ. ඉතිරි මුදල් සියල්ල ගන්නේ ඉන්දියානු රජයයි. එහෙත් ඒ උතුම් ස්ථාන තවමත් පස් යටය. ඒවා පාදාගන්නට හෝ ප්‍රතිසංස්කරණය කරන්නට හෝ ආරක්ෂාකරන්නට හෝ ඉන්දියානු රජයෙන් කිසිදු පියවරක් ගන්නේ නැත.

අද බුද්ධගයාවද බුදුන් වැඩ සිටි අනෙක් ස්ථානවලද පාලනය ඉන්දියාවේ මහාබෝධි සමාගමෙන් වුවද ලංකාවේ පන්සල් වලින් ගොස් සිටින සිංහල හාමුදුරුවරුන් කීප දෙනා හැරෙන්නට අනෙක් ගෝලබාලයන් සියළු දෙනා බෞද්ධයන් නොවන ඉන්දියන් කාරයෝය. එකම ඉන්දියානු බෞද්ධයෙක් ඒ අහලකවත් නැත. එම ඉන්දියානුන්ගේ පාලනය යටතේ අපේ හාමුදුරුවරුන් අසරණ තත්වයක ඉන්නා බවකි අපට හැඟුණේ. වන්දනාකාරයින් රවටා මුදල් ගරන බොරු ශ්‍රමණ වේශධාරීන් ඒ වටා සිටින්නේ ඒ නිසා විය හැකිය. ළඟක සිට එහි නායකත්වය සිංහල හාමුදුරු කෙනෙක් දැරුවද ඉන්දියන්කාරයි-

සිංහල හාමුදුරු කෙනෙක් දැරුවද ඉන්දියන්කාර යින් අබිබවා යන්නට උන්වහන්සේට හැකියාවක් නැති බව පෙනේ.

මේ විදියට ගියහොත් තව ඉතා ටිකලකින් දඹදිව බෞද්ධ සිද්ධස්ථාන සියල්ල අතුරුදහන්ව යනවා ඇත. ඒවා රැකබලා ගන්නට ඉන්දියාවට උවමනා නැත. අනගාරික ධර්මපාලතුමා නඩු කියා, අරගල කර එම ස්ථාන උදෙසා කොතරම් වෙහෙසක් ගත්තාදැයි අපි දනිමු. මේ ස්ථාන වැනසී යා නොදී රැකගැන්මට ජනාධිපතිතුමා, අගමැතිතුමා ප්‍රමුඛ ශ්‍රීලංකා රජයේ වගකිව යුත්තන් වහා පියවර ගනු ඇතැයි අපේ ඉමහත් බලාපොරොත්තුවයි.

එසේම දඹදිව යන අපේ බෞද්ධයින්ට මා ආයාචනාකරන්නේ ඔබත් මේවා දැක දෑස් පියා නොසිට වගකිවයුතු අයවෙත තම විරෝධය පළකරන ලෙසය. ඉන්දියාව කිසිදාක බුදුදහම රකින්නට කිසිදු පියවරක් නොගන්නා බව පැහැදිලිය. එනිසා අප අන් බෞද්ධ ලෝකයේත් ලොවපුරා සිටින සංඝයා වහන්සේලාගේත් අවධානය මෙයට යොමු කරවිය යුතුය. එසේ නොකළ හොත් ඉතා ළඟදීම බුදුදහම ලෝකයෙන් තුරන්ව යනු ඇත. බෞද්ධයින් නෝංජල් පිරිසක් බවට දැන් ඇති මතය තවත් තහවුරු වෙනවා ඇත.

♦ මාලා කරුණාරත්න
London NW3



## ඉන්දියාව මේ එන්නේ මොකාටද?



හ නු ම න් තා

**ඉ**න්දියාව නිසා අපේ ලංකාව මේ දිනවල නොසන්සුන් ගතියෙන් සිටින බව අපට පැහැදිලිව පේනව. ඉන්දියන් චිත්‍රපට උළෙලක් ලංකාවේ මේ නොබෝදා පැවැත්වූ බවත් අපි දන්නවා. එයට ලංකාව මිලියන ගණනක් මුදල් වියදම් කර ඇති බවට අපේ විපක්ෂය චෝදනා කරනවා. රනිල් වික්‍රමසිංහ මහතා ඒ ගැන රජයෙන් විමසූ විට ඔහුට ඇමතිවරයෙක් කොටියාය කියා බැන්න බවක්ද පුවත් පත්වල පළවුණා. (කොටින්ම ඉන්දියන් චිත්‍රපටි උළෙල ඉන්දියාවෙ තියන්නෙ නැතුව කිසිම සම්බන්ධකමක් නැති ලංකාවට මොකට ගෙනාවද කියලා මට තවම ප්‍රෙහෙළිකාවක්) ඉන්දියාවට එරෙහිව ලංකාවේ ඉස්සර වගේ ආයිත් පෙළපාලි පටන්ගන්න යන බවකුත් පෙනෙන්නට තියෙනවා. මා මේ කියන්න යන්නෙ ඒ කිසි දෙයක් ගැන නෙවෙයි. ඉන්දියාව මෙතන ගෙනයන භූමිකාව මොකක්ද කියන එක නොතේරෙන හින්දයි. භූමිකාව සරල බාසාවෙන් කියනවා නම් රඟපෑමයි. රඟපෑමක් කියන්නෙ බොරුවක්. චිත්‍රපටියක හරි නාට්‍යයක හරි කෙනෙක් රඟපානව කියන්නෙ ඇත්ත දෙයක් නෙවෙයි නේ. ඒ වෙලාවට කරන මවාපෑමක් නේ. ( චිත්‍රපටිවල විස්සක් තිහක් එක්ක තනියම ගහගන්න වීරයා, ඇත්ත ජීවිතේදී පොඩි හාදයෙකුගෙන් අම්බානක ගුටි කනවා අපි දැකලා තියනවා) ඒ නිසා ඉන්දියාව මේ නිරූපණය කරන චරිතය දිහා අපි විමසිල්ලෙන් බලන් ඉන්න එක වැදගත්. අපි දන්නෙ නෑ මේ එන්නෙ මොකාටද කියලා.

මම හැමදාම හිතන දෙයක් තමයි ඉන්දියාව කවදාවත් අපේ මිතුරෙක් නොවෙන බව. ඒ රට අපව ඉහේ කෙස්ගානෙ ආක්‍රමණය කරලා තියෙනවා. කෙනෙක් කියන්න පුළුවන් ඒ දකුණු ඉන්දියාවය එහෙම කළේ, උතුරු ඉන්දියාව නෙවෙයිය කියලා. එහෙනම් කෙහොමද ඉන්දිරා ගාන්ධි දකුණු ඉන්දියාවෙ කොටි ත්‍රස්තවාදීන්ට කඳවුරු හදලා දීලා උන්ව පුහුණු කරලා ඔඩොක් කුවෙ තියාගෙන කිරි පොවලා අපිව නැතිකරන්න එළියට දැම්මෙ. අන්න ඒ තමයි රඟපෑම. ලංකාව අපේ හොඳ මිත්‍රයෙක් තමයි කියලා ඉන්දිරාගෙ ඉන්දියා රජය හෙමිහිට යටින් වැඩේ දුන්නා.

ඉන්දියාවට ඕන කලාපයේ බලවතා වෙන්න චණ්ඩියා වෙන්න. ඒ පැත්තෙ අයියා වෙන්න. අපි ෂොකඩයො වගේ ඉන්දියාවට ඔළුව නවාගෙන ඉන්න ඕන. දැන් අපේ සමහරු කියනවා ඉන්දියාව කොටි නැතිකරන්න අපිට යටින් උදව් දුන්නය කියලා. ඔන්න ඕවට තමයි කියන්නේ පියෝ බුල් ෂිට් කියලා. බම්බුවක් උදව්දුන්නා. දීපු කෙහෙල් මලක් නැහැ. දැනගත්ත කොටි පරදිනවා දැන් කරන්න දෙයක් නෑ කියලා. අන්න ඒ පාර උදව්වට එනව වගේ පෙන්නුවා. ඒකයි රඟපෑම කියන්නෙ.

අන්න දැන් ලංකාව එක්ක වෙළඳ ගිවිසුමක් අත්සන් කරන්න යනවා. ඒ හදන්නෙ අපිව බැඳ ගන්න. ඉන්දියාව නොකිය කියනවා චීනෙ අයින් කරපං කියලා. අපි චීනත් එක්ක හොඳයි කියලා ඉන්දියාව දැන් තද වෙලා ඉන්නෙ. ඒ ගිවිසුම අත්සන් කළොත් කාරණා දන්න උදවිය කියන විදියට අපිව ජීවිතේටම බැඳලා තියනවා. ඊට පස්සෙ අපට ඕන කෙනෙක් එක්ක ආශ්‍රය කරන්න අපට බැහැ. අපි ඉන්දියාව කියන දේ කරන්න ඕන.

දැන් ඉන්දියාව ලංකාව පුරාම පාස්පෝට් කාර්යාල ඇරගෙන යනවා. නුවර ඇරියා නුවර එළියෙ ඇරියා යාපනේ අරිනවා හම්බන්තොට කාර්යාලයක් ඇරියා. මේ මොකටද ලංකාව පුරාව පාස්පෝට් කාර්යාල අරින්නෙ.? මොකා ඉන්දියාවට යවන්නද? අපේ කවුරුවත්, ඒ කියන්නෙ අඩු ගණනෙ ඔය කටහැකර මර්වින් සිල්වා වත් තවම ඇහුවෙ නෑ මොකටද බොලා මෙච්චර පාස්පෝට් ඔපීස් අපේ රටපුරා අරින්නෙ කියලා.

රාමායනය කියන බොරු බේගල් අද්භූත කතාවෙ තියනවා හනුමා කියන වඳුරා වල්ගෙ වෙලිච්ච පොල් කොළ අත්තක් බැඳ ගෙන ඇවිත් ලංකාවට පැනලා මුළු ලංකාවටම ගිනි තිබ්බය කියලා. ඒක ඒ කාලෙ මිත්‍යා කතාවක් වුණාට දැන් ඒක ඇත්තට සිද්ධ වේගෙන එන ලකුණු අපට පේනවා නේද මලේ ?

♦ වෙලේගෙදර රාළ London